**සීමාසහිත එන්එස්බී අරමුදල් කළමනාකරණ සමාගම - 2016**

---------------------------------------------------------------------

2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ සීමාසහිත එන්එස්බී අරමුදල් කළමනාකරණ සමාගමේ ("සමාගම") මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි.
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මෙම වාර්තාව නිකුත් කරනු ලැබේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම**

---------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ ("අධ්‍යක්ෂ මණ්ඩලය") වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

--------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. ආචාරධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව්කිරීම්වලට අදාල වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස බැංකුවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් බැංකුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ
.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**2. මූල්‍ය ප්‍රකාශන**

----------------

**2.1. මතය**

-------

මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

## 2.2 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතාවයන් පිළිබඳ වාර්තා කිරීම

(අ) 2007 අංක 07 දරන සමාගම් පනතේ 163(2) වගන්තිය ප්‍රකාරව මා විසින් පහත සඳහන් දේ ප්‍රකාශ කරමි. මතය සඳහා පදනම, විගණනයේ විෂයපථය සහ සීමාකිරීම් ඉහත දක්වා ඇති පරිදි වේ.

(ආ)
- විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු හා පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද බවත් මාගේ පරීක්ෂණයෙන් පෙනීයන අන්දමට සමාගම විසින් විධිමත් ගිණුම්කරණ වාර්තා පවත්වා ඇති බවත්,
- සමාගමේ මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 වන වගන්තියේ අවශ්‍යතාවයන්ට අනුකූල වන බවත් මා දරන්නා වූ මතය වේ.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2016 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා සමාගමේ මෙහෙයුම්වලින් වූ ප්‍රතිඵලය රු. 109,141,803 ක බදු පෙර ශුද්ධ ලාභයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ බදු පෙර ශුද්ධ ලාභය රු.252,762,389 ක් වූයෙන් සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලයේ රු. 143,620,586 ක හෙවත් සියයට 57 ක පහළයාමක් දැක්වුණි.

ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී, ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම් මත පොලී වියදම් සහ මූල්‍ය සාධන පත්‍ර සාධාරණ වටිනාකමට අගය කිරීම මත ඇතිවන අලාභය පිළිවෙලින් රු.183,390,059 කින් හා රු.101,195,961 කින් වැඩි වීම මූල්‍ය ප්‍රතිඵලයේ මෙම පහළ යාම සඳහා බලපෑ ප්‍රධාන හේතු විය.

### 3.2 එකතු කළ අගය

සමාලෝචිත වර්ෂය සඳහා සමාගමේ ලාභය රු.79,417,377 ක් වුවද, සමාලෝචිත වර්ෂය සඳහා එකතුව රු.78,972,710 ක සේවක පාරිශ්‍රමික, ක්ෂය වීම් හා රජයට ගෙවිය යුතු බදු සැලකිල්ලට ගත් පසු සමාගමේ එකතු කළ අගය 2015 වර්ෂයේ පැවති රු.309,886,722 සිට රු.158,390,087 ක් දක්වා 2016 වර්ෂයේදී අඩු වී තිබුණි.

### 3.3 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

#### 3.3.1 වැදගත් ගිණුම්කරණ අනුපාත

ලබාගත හැකි තොරතුරු වලට අනුව, ඉකුත් වර්ෂය හා සමාලෝචිත වර්ෂය සඳහා සමාගමේ ගිණුම්කරණ අනුපාත හා ආංශික අනුපාත විශ්ලේෂණයෙන් පසු, වැදගත් නිරීක්ෂණ කිහිපයක් පහත දැක්වේ .

(අ) සමාගමේ අවදානම මත බරතැබූ ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය ආංශික අනුපාතය වූ සියයට 22 ට වඩා වැඩි වුවත්, 2015 වර්ෂය සමඟ සැසඳීමේදී එය සියයට 7 කින් පහළ බැස තිබුණි.

(ආ) සමාගමේ සාමාන්‍ය වත්කම් මත ප්‍රතිලාභය හා සාමාන්‍ය හිමිකම මත ප්‍රතිලාභය 2015 වර්ෂයේ පැවති සියයට 2 සහ සියයට 14 පිළිවෙලින් සියයට 1 සහ සියයට 6 දක්වා අඩු වී තිබුණි. එසේම, එම අනුපාත සමාලෝචිත වර්ෂය සඳහා වූ ආංශික අනුපාතවලට වඩා අඩුවෙන් පැවතුණි.

(ඇ) සමාගමේ මූලික ප්‍රාග්ධනය 2015 වර්ෂයේ පැවති රු. මිලියන 1,731 සිට 2016 වර්ෂයේදී රු. මිලියන 1,691 දක්වා සියයට 2 කින් අඩු වී තිබුණි. කෙසේ වුවද, මූලික ප්‍රාග්ධනය අවම අවශ්‍යතාවය වූ රු. මිලියන 1,000 ට වඩා වැඩි වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

### 4.1 සමාගමේ කාර්යසාධනය

--------------------------

ලබාගත හැකි වූ තොරතුරු අනුව සමාගමේ මූලික පරමාර්ථ වන්නේ,

(අ) ප්‍රාථමික ගණුදෙනුකරුවකු ලෙස ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාම.
(ආ) භාණ්ඩාගාර බිල්පත්, භාණ්ඩාගාර බැඳුම්කර සහ වෙනත් රජයේ හා මහබැංකු සුරැකුම්පත්වල ද්විතීයික වෙළඳපල ගණුදෙනුවල නිරත වීම.
(ඇ) භාණ්ඩාගාර බිල්පත්, භාණ්ඩාගාර බැඳුම්කර සහ වෙනත් රජයේ හා මහබැංකු සුරැකුම්පත්වල ද්විතීයික වෙළඳපල ප්‍රවර්ධනය හා සංවර්ධනයයි.
ඉහත පරමාර්ථ ක්‍රියාත්මක කිරීමේදී, 2015 හා 2016 වර්ෂවල දෙසැම්බර් 31 දිනට ප්‍රාථමික හා ද්විතීයික වෙළඳපලේ කළ ආයෝජනයන් ආංශික තොරතුරු සමඟ සසඳා පහත දැක්වේ.

| **ආයෝජන වල ස්වභාවය** | **අංශය** | **සමාගම** | |
|---|---|---|---|
| | **2016** | **2016** | **2015** |
| | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** |
| වෙළඳ සුරැකුම්පත් (Trading Securities) | 98,100 | 7,013 | 4,262 |
| පරිණත වන තෙක් පවතින ( Held to maturity) | 106,800 | 1,801 | 2,211 |
| විකිණීම සඳහා පවතින (Available for sale) | 19,300 | 1,894 | 2,020 |
| **මුළු ආයෝජන** | **224,200** | **10,708** | **8,493** |

ඉහත තොරතුරු අනුව, රජයේ සුරැකුම්පත්වලින් වැඩි පොලී ආදායමක් ඉපයීම සඳහා, සමාගම එහි ආයෝජන කළඹෙන් සියයට 65 ක් වෙළඳ සුරැකුම්පත් ලෙස පවත්වාගෙන තිබුණි. කෙසේ වුවද, එවැනි ඉහළ කළඹක් පවත්වාගෙනයාම සමාගමට ඉහළ වෙළඳපල අවදානමක් නිර්මාණය කළ හැකිය.

## 5. ගිණුම්කටයුතු භාවය හා යහපාලනය

---------------------------------------------

### 5.1 සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්ම

---------------------------------------------------

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී /12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5 වන පරිච්ඡේදය පරිදි, සමාගම 2016 වර්ෂය සඳහා සංයුක්ත සැලැස්මක් හා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

## 6. පද්ධති හා පාලන

---------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු සමාගමේ සභාපතිවරයා වෙත වරින් වර දන්වා යවන ලදි. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු වේ.

| පාලන ක්ෂේත්‍රය | **නිරීක්ෂණ** |
| --- | --- |
| (අ) මූල්‍ය කළමනාකරණය | කර්මාන්තයේ නියමයන් සමඟ සමානුපාතික වන ශක්තිමත් සාමාන්‍ය වත්කම් හා සාමාන්‍ය හිමිකම් මත ප්‍රතිලාභයන් පවත්වා ගැනීමට අවධානය දැක්විය යුතුය. |
| (ආ) සැලසුම්කරණය | සමාගමේ ප්‍රධාන අරමුණු ඉලක්කගත කාලපරිච්ඡේදය තුලදී ළඟාකර ගැනීමට සංයුක්ත සැලැස්මක් හා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතුය. |